# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 30 වැනි කාණ්ඩය | දෙසැම්බර් 2022



## ඉතිහාසයේ දිනකදී වාර්තාගත වැඩිම පාසල් සිසුන් සංඛ්‍යාවක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පැමිණෙයි

පාර්ලිමේන්තු ඉතිහාසයේ දිනක දී වාර්තාගත වැඩිම පාසල් සිසුන් සංඛ්‍යාවක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා මේ මස 01 වැනිදා පැමිණි බව වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා පැවසීය. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් පාසල් 32 කට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5000 කට අධික පිරිසකට මෙදින පාර්ලිමේන්තුව නැරඹීමේ අවසරය ලබා දී ඇති බවද ඒ මහතා වැඩි දුරටත් පැවසීය.

# අන්තර්ගතය

## පුවත්

■ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය යුනිසෙෆ් සමග එක්ව  සංවිධානය කළ විශේෂ සැමරුම් වැඩසටහනක් පාර්ලිමේන්තුවේ දී

■ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලියේ ජයසංකේත සහ සහතික පත් ප්‍රදානය කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන්

■ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය  පිටුදැකීමට පාර්ලිමේන්තුව තැඹිලි පැහැ ගැන්වෙයි...

## කාරක සභා පුවත්

■ ඇගයීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් කෝපා කමිටුවට සහය දැක්වීමේ විශේෂ වැඩසටහනක් පාර්ලිමේන්තුවේ දී..

■ ශ්‍රී ජයවර්ධපුර රෝහලේ පරිපාලන දුර්වලතා රැසක් කෝප් කමිටුවේ අවධානයට.

■ ධීවරයන්ගේ ඉන්ධන ප්‍රශ්නය විසඳීමට ලබන වසරේ සිට විදුලි මෝටර් බෝට්ටු හඳුන්වා දෙනවා - ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී පවසයි.

■ ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය මානෙල් ද? නිල් මානෙල් ද? පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී සාකච්ඡා කෙරේ.

■ සංචාරකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් නව ජංගම යෙදවුමක් - අමාත්‍ය හරීන් ප්‍රනාන්දු.

■ විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ යෝජනා කිරීමට සඳහා කැබිනට් මණ්ඩලය  විසින් පත්කළ කමිටුවේ වාර්තාව, ප්‍රතිපත්ති සම්පාදන ජාතික සභා අනුකමිටුවේ දී සාකච්ඡාවට.

■ ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට ජනාධිපති ලේකම්වරයාගේ සභාපතීත්වයෙන්  අනුකමිටුවක්....

■ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ මහතා තරුණයන් වෙනුවෙන් වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිවරයා ලෙස තේරී පත්වෙයි.

■ ආර්ථිකය අර්බුදය හමුවේ ජනමාධ්‍ය ආයතනවලටත් අභියෝග රැසකට මුහුණ දෙන්න සිදුවෙලා - ආර්ථික ස්ථායිකරණ ජාතික සභා අනුකමිටුව හමුවේ ජනමාධ්‍යවේදීහු පවසති.

■ කැසිනෝ ව්‍යාපාර (නියාමනය) පනත යටතේ නියමය සහ නියෝග සඳහා දැඩි කොන්දේසි යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමි වෙයි.

■ ජාත්‍යන්තර භික්ෂු නියෝජිත පිරිසක් කථානායකවරයා හමුවෙති.



කවරයේ කතාව

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# කවරයේ කතාව



# ඉතිහාසයේ දිනක දී වාර්තාගත වැඩිම පාසැල් සිසුන් සංඛ්‍යාවක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පැමිණෙයි.

පාර්ලිමේන්තු ඉතිහාසයේ දිනක දී වාර්තාගත වැඩිම පාසල් සිසුන් සංඛ්‍යාවක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා මේ මස 01 වැනිදා පැමිණි බව වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා පැවසී ය.
ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් පාසල් 32 කට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5000 කට අධික පිරිසකට මෙදින පාර්ලිමේන්තුව නැරඹීමේ අවසරය ලබා දී ඇති බව ද ඒ මහතා වැඩි දුරටත් පැවසී ය.
ලෝක පාර්ලිමේන්තු සමග සැසඳීමේදී ද එක් දිනක් තුළ මෙපමණ පිරිසක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පැමිණීම වාර්තාවක් විය හැකි බව ද තවදුරටත් වේත්‍රධාරීවරයා සඳහන් කළේ ය.

# පුවත්






# ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය යුනිසෙෆ් සමග එක්ව සංවිධානය කළ විශේෂ සැමරුම් වැඩසටහනක් පාර්ලිමේන්තුවේදී

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සංවත්සරික විශේෂ සැමරුම් වැඩසටහනක් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේ දී පැවැත්විණි.

ළමා අයිවාසිකම් තවදුරටත් සුරක්ෂිත කිරීම තහවුරු කිරීම උදෙසා "ළමයින් සදහා වන පාර්ලිමේන්තු සංසදය" එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF ආයතනය) සමග එක්ව මෙම සැමරුම් උත්සවය සංවිධානය කර තිබිණි.

1989 නොවැම්බර් 20 වැනි දින ප්‍රකාශයට පත්වූ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට මේ වන විට වසර 33ක් සපිරේ.
ශ්‍රී ලංකාව එම සම්මුතියට 1991 වසරේ දී අත්සන් තබා ඇති අතර මෙම සම්මුතියේ 25 වැනි සංවත්සරය යෙදුණු 2014 වසරේ දී "ළමයින් සදහා වන පාර්ලිමේන්තු සංසදය" පිහිටුවා ඇත.









ළමා අපයෝජන ඇතුළු සිද්ධීන් දිනෙන් දින වැඩිවන බව වාර්තා වන බැවින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය නෛතික වෙනස්කම් සිදු කිරීමට කටයුතු කරන බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මෙහි දී අදහස් දක්වමින් පැවසී ය.



ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිනිය වන ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මෙහි දී පවසා සිටියේ සෞඛ්‍ය, පෝෂණය, අධ්‍යාපනය, ඇතුළු අදාළ ක්ෂේත්‍රවල ළමයින්ට බලපාන ගැටලු, අඩුපාඩු විසඳා දීමට සිය සංසදය ඉදිරියේ දී මැදිහත් වන බවයි.



මෙහි දී ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ කාර්ය භාර්ය ඇගයීමට ලක් කළ ශ්‍රී ලංකාවේ යුනිසෙෆ් නිත්‍ය නියෝජිත ක්‍රිස්ටියන් ස්කූග් මහතා අදහස් දක්වමින් කියා සිටියේ දරුවන්ගේ සුරක්ෂිත බව වෙනුවෙන් දියත් කරන වැඩසටහන් සඳහා ඉදිරියේ දීත් සහයෝගය ලබා දෙන බවයි.



අධ්‍යාපන අමාත්‍ය, සභානායක ගරු සුසිල් ප්‍රේමජයන්ත, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස, මෙම සංසදයේ ආරම්භක සභාපතිනිය වන වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ යන මහත්ම මහත්මීහු ද මෙම අවස්ථාවට එක්වෙමින් අදහස් දැක්වූහ.



# පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලියේ ජයසංකේත සහ සහතික පත් ප්‍රදානය කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලියේ ජය සංකේත සහ සහතික පත් ප්‍රදානය ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තුවේ බිලියඩ් ශාලාවේ දී මේ මස (08) වැනිදා පැවැත්විණ.



අංශ 06 ක් යටතේ තරඟාවලිය පැවැත්විණ. දාම් තරඟ අංශයේ ශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.එච්.එම්. ධර්මසේන මහතා දිනා ගත්තේ ය. එහි අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයාෂාන් නවනන්ද මහතා විසින් දිනා ගනු ලැබී ය.



පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයාෂාන් නවනන්ද මහතා චෙස්,කැරම් සහ ස්නුකර් යන තරඟ අංශ 03 හි ශූරතාව දිනා ගැනීමට සමත්වීම විශේෂත්වයකි. මේස පන්දු තරඟ අංශයේ ශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වරුණ ලියනගේ මහතා දිනා ගත්තේ ය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් බණ්ඩාර මහතා චෙස් සහ ස්නුකර් යන තරඟ අංශවල අනුශූරතාව දිනා ගැනීමට සමත් විය. කැරම් අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දුමින්ද දිසානායක මහතා දිනා ගත් අතර මේස පන්දු අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයාෂාන් නවනන්ද මහතා දිනා ගත්තේ ය.



පූල් ක්‍රීඩා ශූරතාව ද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයාෂාන් නවනන්ද මහතා දිනා ගත් අතර එහි අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දුමින්ද දිසානායක මහතා දිනා ගත්තේ ය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලිය මෙවර පැවැත්වුණේ 03 වැනි වරටයි. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ කේ. පී. ඊ. නන්දදේව මහතා තරඟ විනිශ්චය කිරීමෙන් දායක විය.



ජයසංකේත සහ සහතික පත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස යන මහත්වරුන් ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් පිරිසක් ද, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක, වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු යන මහත්වරුන් ඇතුළු පිරිසක් ද එක්ව සිටියහ.

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිටුදැකීමට පාර්ලිමේන්තුව තැඹිලි පැහැ ගැන්වෙයි...

■ ජනාධිපතිතුමා, අගමැතිතුමා, කථානායකතුමා ඇතුළු මහජන නියෝජිතයෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ගෝලීය ක්‍රියාකාරීත්වය (GBV) වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සමග එක්වෙති.

■ සහයෝගය දැක්වීමක් ලෙස මන්ත්‍රීවරයන්ට "කාන්තා හිංසනය පිටුදකින්නට අපි එක්වෙමු" යන වැකිය සහිත අත් පළඳනාවක්.







ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට (GBV) එරෙහිව දින දහසයක ගෝලීය ක්‍රියාකාරීත්වයට සහය දැක්වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ප්‍රධානත්වයෙන් ක්‍රියාකාරකම් රැසක් මේ මස 01 වැනිදා පාර්ලිමේන්තුවේ දී පැවැත්විණි. මෙම වැඩසටහනට සහයෝගය දැක්වීම පිණිස පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් සහ කාර්ය මණ්ඩලයේ නිලධාරිනියන් තැඹිලි වර්ණයෙන් සැරසී සිටියහ.

 ඒහිදී "කාන්තා හිංසනය පිටුකින්නට අපි එක්වෙමු" යන වැකිය සහිත අත් පළඳනාවක් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත පළඳවන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ඇතුළු එම සංසදයේ සාමාජිකාවන් විසිනි. මේ අවස්ථාවට කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ද සහභාගී වූවා ය. මෙහි දී ජනාධිපතිවරයා දන්වා සිටියේ කාන්තා පනත කෙටුම්පත් කිරීම ඉතා ඉක්මනින් අවසන් කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙසයි.



මෑතක දී පාර්ලිමේන්තුවේ දී පිහිටුවන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාව හා සමානාත්මතා අංශයේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පරිශීලනය කිරීම සඳහා ජාතික ප්‍රජාතන්ත්‍රවා දී ආයතනය විසින් පරිත්‍යාග කරන ලද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට සහ සමාජ අන්තර්ගතකරණයට අදාළ ප්‍රකාශනවල විස්තර ඇතුළත් පත්‍රිකාවක් ද ජනාධිපතිවරයා වෙත පිරිනමන ලදී.

 "කාන්තා හිංසනය පිටුදකින්නට අපි එක්වෙමු" වැකිය සහිත අත් පළඳනාව ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාට, කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට, විපක්ෂ

නායක ගරු සජිත් ප්‍රේමදාස මහතාට පැළඳවීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව හා සමානාත්මතා අංශය පිළිබඳ පත්‍රිකා පිරිනැමීම ඉන් අනතුරුව සිදු කෙරිණි.

අනතුරුව පැවති මාධ්‍ය හමුවේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් “එක්සත් වන්න! කාන්තාවන්ට සහ ගැහැනු ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීමේ ක්‍රියාකාරීත්වය” නම් 2022 වසරේ ගෝලීය තේමාව පිළිබඳව මෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට සියලු දෙනාගේ එකමුතුකම අත්‍යාවශ්‍ය සාධකයක් බවත්, ඊට එරෙහිව කටයුතු කිරීම සඳහා රජයන්, සංවර්ධන හවුල්කරුවන්, සිවිල් සමාජ ක්‍රියාධරයන්, තරුණයින්, මාධ්‍ය සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ලැබිය යුතු බවත්, අවධාරණය කරන ලදී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජනතාව දැනුවත් කිරීමේ අපේක්ෂාවෙන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලය හා සන්නිවේදන දෙපාර්තමේන්තුව එක්ව මෙම වැඩසටහන් සංවිධානය කරන ලද අතර ඒ සඳහා ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය (NDI) විසින් අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.


















# කාරක සභා පුවත්













# ඇගයීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් කෝපා කමිටුවට සහය දැක්වීමේ විශේෂ වැඩසටහනක් පාර්ලිමේන්තුවේ දී

රාජ්‍ය ආයතනවල ඇගයීම් ක්‍රියාවලිය වඩාත් පුළුල් කිරීම සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට (කෝපා කමිටුවට) සහය දැක්වීම සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් කෝපා කමිටු මන්ත්‍රීවරයන්ගේ සහභාගීත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේ දී පැවැත්විණි.



කෝපා කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා ඇගයීම් සංගමය ( Sri Lanka Evaluation Association / SLEvA) සම්පත් දායකත්වය ලබාදීම සිදුවිය.



ජාතික ඇගයීම් පනත් කෙටුම්පතේ මූලික කටයුතු අවසන් කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සහ ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ධාරිතාව සහතික කිරීම පිණිස අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව මගින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද මෙහි දී සාකච්ඡා විය.



එසේම පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලයක් ස්ථාපිත කිරීමේ දී ඇගයීම් ඒකකයක් සථාපිත කිරීමට ඇති හැකියාව පිළිබදව ද  කරුණු ඉදිරිපත් විය. ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම කඩිනම් කිරීමේ අවශ්‍යතාව ද මෙහි දී අවධාරණය කෙරිණි.

විධිමත් ජාතික ඇගයීම් ක්‍රියාවලියක අවශ්‍යතාව අවධාරණය කළ කෝපා සභාපතිවරයා මෙහි දී පවසා සිටියේ මෙම වැඩසටහන මූලික සාකච්ඡාවක් බවත්, ඉදිරියේ දී වඩාත් පුළුල් ලෙස මේ පිළිබදව සාකච්ඡා කොට අවශ්‍ය පියවර කඩිනමින් ගැනීමට අපේක්ෂා කරන බවයි.







# ශ්‍රී ජයවර්ධපුර රෝහලේ පරිපාලන දුර්වලතා රැසක් කෝප් කමිටුවේ අවධානයට...

- **විගණකාධිපතිගෙන් විශේෂ විමර්ශන වාර්තාවක් කැඳවයි...**
- **මාස තුනකින් යළි කැඳවීමක්...**

මේ මස 06 දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් රැස් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව) විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහල සම්බන්ධයෙන් ඇති ගැටලු හඳුනාගන්නා ලදී.

ශ්‍රී ජයවර්ධනපුර රෝහල සම්බන්ධව විගණකාධිපතිතුමා විසින් මීට වසර 5 කට පෙර සිදු කරන ලද විගණනයකට අදාළ තොරතුරු සහ වර්තමාන කාර්ය සාධනය පිළිබඳව ඉදිරිපත් කරන ලද විගණන වාර්තා පදනම් කරගෙන කෝප් කමිටුව රැස් විය. එහි දී විගණකාධිපති තුමාගේ වාර්තාවේ සඳහන් වෙන සියලු කාරණා සාකච්ඡාවට බඳුන් විය.

විශේෂයෙන් ශ්‍රී ජයවර්ධනපුර ආරෝග්‍යශාලා මණ්ඩල පනත, එහි දැක්ම මෙහෙවර, අරමුණු, සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කර ඇති ආකාරය පිළිබඳව කරුණු සාකච්ඡාවට ගැනුණි. එසේම උක්ත පනතට අනුව එහි අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීමේ දී රෝහල් කාර්යමණ්ඩල නියෝජනය කෙරෙන ආකාරයට පත් කිරීම් සිදු කිරීම පිළිබඳව ලැදියාවේ ගැටුමක් (conflict of interest) ඇත්දැයි සැලකිල්ලට ගෙන එවැන්නක් තිබේ නම් එය වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

විගණකාධිපතිතුමන් පෙන්වා දී ඇති කළමනාකරණ දුර්වලතා සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු විය. එහි දී දීර්ඝ කාලීනව සහ කෙටි කාලීනව ප්‍රමාණවත් සැලැස්මක් නොමැති නිසාවෙන් සැලසුම් සම්බන්ධයෙන් බරපතල දුර්වලතාවයක් ඇති බවත් පසක් විය. ඒ අනුව මෙම ආයතනයේ දැක්ම අනුව වසර 2030 දී දකුණු ආසියාවේ හොඳම රෝහල බවට පත් කිරීමේ ඉලක්කයට ළඟා වීම සඳහා සුදුසු උපායමාර්ගික සැලසුම් මාස 2 ක් තුළ ඉදිරිපත් කිරීමට යෝජනා විය. එම සැලසුම්වලට මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, අලෙවි සහ ව්‍යාපාර සංවර්ධන සැලස්ම, සහ විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී තිබෙන පරිපාලන ගැටලු පෙන්වා දීම සඳහා කටයුතු කරන්නේ කෙසේද යන කාරණා ඇතුළත් විය යුතු බව සඳහන් කෙරුණි. එසේම සකස් කරන ලද






සැලැස්ම කෝප් කමිටුවට ඉදිරිපත් කිරීමට ද නිර්දේශ කෙරුණි.
ශ්‍රී ජයවර්ධනපුර රෝහල පරිශ්‍රයට අයත් ඉඩමේ ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන අනවසර පදිංචිකරුවන් සිටිනම් ඔවුන්ව ඉවත් කිරීම සඳහා ඉක්මනින් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත් කෝප් කමිටුවෙන් නිර්දේශ කෙරුණි.

විගණකාධිපතිතුමාගේ විගණන වාර්තාවේ දැක්වෙන පරිදි විවිධ උපදේශන සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් මුදල් ගෙවා ඇති නමුදු සේවා නිම නොකළ ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ මුදල් නැවත අය කරගැනීම සඳහා පියවර ගැනීමට කෝප් කමිටුවෙන් නිර්දේශ කෙරුණි.

කෝප් කමිටුව ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ පරිපාලන ගැටලු විශාල සංඛ්‍යාවක්



හඳුනා ගත්තේය. ඒවා සඳහා වන විසඳුම් සාකච්ඡාවට ගැනුණි. ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කෝප් කමිටුවෙන් අනුකමිටුවක් පත් කිරීමට තීන්දු කෙරුණි. එම අනුකමිටුව රෝහල් පරිශ්‍රයට ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ සියලුම වැදගත් අංශ ආවරණය වෙන පරිදි විශේෂ විගණන වාර්තාවක් පිළියෙල කරන ලෙස විගණකාධිපතිතුමාට කෝප් කමිටුව විසින් දැනුම් දෙන ලදී.

රෝහලේ සියලුම කාර්ය මණ්ඩල ඇතුළත් වෙන ලෙසට සහ එහි කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා අනුකමිටු කිහිපයක් පත් කර ඒවායේ සහය ලබා ගන්නා ලෙසට අධ්‍යක්ෂක මණ්ඩලය වෙත කෝප් කමිටුවෙන් නිර්දේශ කෙරුණි.

2015 වර්ෂයේ දී සර්වේ ජනරාල්වරයා විසින් රෝහලේ ඉඩම් ප්‍රමාණය මැනුම්ගතකොට තිබුණි. නමුත් එසේ තිබිය දී පෞද්ගලික මිනුම්දෝරුවරයෙකු ලවා රෝහල් ඉඩම නැවත මිනුම්ගත කොට තිබුණි. එහිදී මිනුම්පතිවරයාගේ පිඹුර තිබිය දී නැවත පෞද්ගලික මිනුම්දෝරුවරයෙක් ලවා මැනුම් කටයුතු සිදුකළේ කුමක් සඳහා ද ඒ සඳහා සම්බන්ධ වුණ නිලධාරීන් කවුරුන් ද යන්න නම් ගම් සහිතව සවිස්තරාත්මක වාර්තාවක් කෝප් කමිටුවට ලබා දෙන ලෙස නීති නිලධාරිනියට කෝප් කමිටුව විසින් නිර්දේශ කෙරුණි.

ස්නායු ශල්‍ය ඒකකය සඳහා රු මිලියන 4.2 ක් වියදම් කර මිලදී ගෙන තිබුණ ශල්‍ය ද්‍රව්‍ය වලින් 80% ක් කල් ඉකුත්වීමට වග කිව යුතු නිලධාරීන්ට ගනු ලබන පියවර සම්බන්ධයෙන් කෝප් කමිටුව විසින් විමසා සිටියේයි එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවකින් සිදු කළ පර්යේෂණ වාර්තාව මීට දින කිහිපයකට පෙර රෝහලට ලැබුණ බව රෝහල් නිලධාරීන් පවසා සිටියහ. එහි දී අමාත්‍යාංශ ලේකම්වරයාට කෝප් කමිටුවෙන් නිර්දේශ කරන ලද්දේ ඒ සම්බන්ධව පූර්ණ පරීක්ෂණයක් සිදුකර සති 2 ක් තුළ වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙසටයි.

මෘදුකාංගයක් සඳහා රු මිලියන 1.8 ක් ද ලේඛන ස්කෑන් කිරීම සහ අප්ලෝඩ් කිරීම සඳහා 2019 වර්ෂයේදී රු මිලියන 19.7 ක් ද වැය කර තිබීම සම්බන්ධයෙන් විගණන විමර්ෂණයට අදාළව පරීක්ෂණයක් සිදු කර සති 2 ක් තුළ එහි වාර්තාව කෝප් කමිටුවට දන්වන ලෙස ද ශ්‍රී ජයවර්ධන-පුර රෝහලේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයා ඇතුළු කළමණාකාරීත්වයට නිර්දේශ කෙරුණි.

මාස 3 ක් ඇතුළත ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට කෝප් කමිටුව වෙත නැවත කැඳවීමට තීරණය විය.







# ධීවරයන්ගේ ඉන්ධන ප්‍රශ්නය විසඳීමට ලබන වසරේ සිට විදුලි මෝටර් බෝට්ටු හඳුන්වා දෙනවා - ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී පවසයි





ධීවරයන්ට මුහුණ දීමට සිදුව ඇති ඉන්ධන ප්‍රශ්නය හේතුවෙන් ලබන වසරේ සිට විදුලි මෝටර් බෝට්ටු හඳුන්වාදීමට පියවර ගන්නා බව ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා මේ මස 29 වැනිදා පැවසී ය.

ඔහු මේ බව පැවසුවේ මේ මස පාර්ලිමේන්තුවේ පැවති ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී ය.

කුඩා මසුන් ඇල්ලීමේ නිරත ධීවරයින්ට බැටරිය භාවිතයෙන් කිලෝමීටර් 100ක් ගමන් කළ හැකි විදුලි මෝටර් බෝට්ටු හඳුන්වා දීමට අපේක්ෂා කරන බවත් දිනකට වියදම රුපියල් 86ක් පමණක් බවත් අමාත්‍යවරයා පෙන්වා දුන්නේ ය.

භූමිතෙල් සහ ඩීසල් භාවිත කරන බෝට්ටු සඳහා සූර්ය පැනල සහ සුළං ටර්බයින මගින් විදුලිය උත්පාදන පහසුකම් ලබාදීම කෙරෙහි ද අවධානය යොමු කර ඇති බව ද අමාත්‍යවරයා සඳහන් කළේය.

මෙම රැස්වීමට එක්වූ රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත මහතා සඳහන් කළේ ධීවරයින් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය විශේෂ ජංගම සේවාවක් සාර්ථකව ක්‍රියාත්මක කරන බවත්, ඒ හරහා ධීවරයන්ගේ ගැටලු රැසකට විසඳුම් ලබාදිය හැකි බවත් ය.

මේ අතර විදේශ රටවලින් ටින්මාළු ආනයනය කිරීම පිළිබඳව මන්ත්‍රීවරුන් කමිටුවේ අවධානයට



යොමු කළහ. බලපත්‍රයක් නොමැති කිසිවකුට ටින්මාළු ආනයනය කිරීමට අවසර නොමැති බව මෙහිදී නිලධාරීහු පෙන්වා දුන්හ.

මේ අතර ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සැපයීම සඳහා මිරිදිය මසුන් ඇල්ලීම දිරිමත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද මෙහි දී සාකච්ඡා විය. මේ සඳහා ජලාශවලට මාළු පැටවුන් මුදා හැරීමේ වැඩපිළිවෙළ පුළුල් කරන ලෙස මන්ත්‍රීවරු ඉල්ලා සිටියහ. ලබන වසරේ තෝරාගත් මිරිදිය ජලාශ 2500කට මත්ස්‍ය පැටවුන් මුදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන බව අමාත්‍යවරයා මෙහිදී දැනුම් දුන්නේ ය.

එමෙන්ම දිවයිනේ විවිධ ප්‍රදේශවල ධීවරයින් මුහුණ දෙන ගැටලු පිළිබඳව මන්ත්‍රීවරු කාරක සභාවේ අවධානයට යොමු කළහ.

# ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය මානෙල්ද? නිල් මානෙල්ද?

## පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කෙරේ...

## නිවැරදි ජාතික පුෂ්පය නිශ්චය කරගැනීම සඳහා විශේෂඥ කමිටුවක්





ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය මානෙල් මල ද? නිල්මානෙල් මල ද? යන්න පිළිබඳව පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. මේ පිළිබඳ සාකච්ඡා වූයේ පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව එහි සභාපති පරිසර අමාත්‍ය ගරු නසීර් අහමඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහි දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උද්භිද විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දීප්ති යකන්දාවල සහ වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල යකන්දාවල යන මහත්ම මහත්මීන් විසින් ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය කුමක් ද යන මැයෙන් වසර ගණනාවක් තිස්සේ නොවිසඳුනු හා මත භේදයට තුඩු දී තිබූ ගැටලුව පිළිබඳ දීර්ඝ ඉදිරිපත් කිරීමක් කරන ලදී.

මහාචාර්ය යකන්දාවල ඉදිරිපත් කළ පරිදි මෙරට ජාතික පුෂ්පය ප්‍රකාශයට පත් කරන ලද්දේ 1986 පෙබරවාරි 26 සිට ය. එනම් ජාතික පුෂ්පය නිල් මානෙල් බවට නිල වශයෙන් කැබිනට් පත්‍රිකාවක් මගින් ප්‍රකාශයට පත් කොට තිබේ. නමුත් එහි නිල් මානෙල් මල පිළිබිඹු කිරීමට භාවිත කොට ඇත්තේ දම් පැහැති මානෙල් මලක ඡායාරූපයක් වන අතර එය සැබෑ නිල් මානෙල් මල නොවන බව මහාචාර්යවරයා පැවසී ය.

ඒ අනුව, 1986 දී සිදුවූ මෙම වරද මහාචාර්යවරයා ඇතුළු පිරිස විසින් 2010 වසරේ දී එවකට සිටි ජනාධිපතිවරයාට,



පරිසර අමාත්‍යවරයාට, පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාට, හා ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරියට දැනුම්දී තිබේ. ඒ අනුව 2015 දී ජාතික පුෂ්පයේ නිවැරදි ඡායාරූපයක් ඇතුළත් කොට තිබේ. නමුත් 2015දී පරිසර අමාත්‍යාංශය විසින් නිවැරදි මලෙහි ඡායාරූපයක් ප්‍රකාශයට පත් කරන අතරම ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පයේ සිංහල නාමය මානෙල් මල ලෙසත් ඉංග්‍රීසි නාමය බ්ලූ වෝටර් ලිලී සහ දමිළ නාමය ලෙස නීලෝත්පලම් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබේ.

මෙහිදී පරිසර අමාත්‍යාංශය විසින් පෙන්වා දුන්නේ නිල් මානෙල් නාමය මානෙල් ලෙස වෙනස් වීමට හේතු වූයේ ඒ පිළිබඳ සිංහල භාෂා ප්‍රවීණයෙකු වන මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතාගෙන් විමසීමේ දී එතුමන් විසින් දක්වන ලද මතය බවයි. එහි දී එතුමාගේ මතය අනුව මානෙල් යන්නෙහි අර්ථය වන්නේ උතුම් වූ නිල්

පුෂ්පය බැවින් ජාතික පුෂ්පයේ සිංහල නාමය මා-නෙල් ලෙස යෙදීම සුදුසු බවට යෝජනාවී තිබේ.



මෙහිදී මහාචාර්ය යකන්දාවල මහතා අවධාරණය කරන ලද්දේ ගෝලීයව පිළිගත් ශාක වර්ගීකරණය පිළිබඳ සම්මතයන්ට අනුව, විද්‍යාත්මක නාමය වෙනස් කිරීමට යටත් විය හැකි නමුත් ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියන පොදු ජන වහරේ භාවිතා වූ පොදු නම් වෙනස් නොකළ යුතු බවයි.

මෙහිදී මහාචාර්ය දෙපළ දක්වා සිටියේ මානෙල් යනු පොදු නාමයක් වන අතර ශ්‍රී ලංකාව තුළ දම් මානෙල්, සුදු මානෙල්, නිල් මානෙල් ආදී මානෙල් වර්ග රාශියක් පවතින නිසා ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය නිල් මානෙල් ලෙස නිවැරදි විය යුතු බවයි.



1986 දී ජාතික පුෂ්පය තෝරා ගැනීමේ කමිටුව විසින් සලකා බලන ලද නිර්ණායක වන ස්වදේශිය වීම හා ආවේනික වීම, උපයෝගීතාවය, ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කම, පෙනුම හා ව්‍යාප්තිය, මෙන්ම අතිරේක නිර්ණායක වන වර්ණය හා ස්වරූපය, ප්‍රතිනිෂ්පාදනය, වෙනත් රටක ජාතික පුෂ්පයක් හෝ වෘක්ෂයක් නොවීම යන සියලු නිර්ණායකයන් සපුරා ඇත්තේ නිල් මානෙල් බව ද මහාචාර්යවරයා පැවසීය.



එහිදී, මහාචාර්ය දීප්ති යකන්දාවල සඳහන් කළේ මුද්දර කාර්යංශය නිල් මහනෙල් මලෙහි පිංතූරයක් සහිත මුද්දරයක් නිකුත් කර ඇති අතර එහි ඇත්තේ ද සැබෑ මල නොව වැරදි මලක පිංතූරයක් බවයි. එමෙන්ම පෙළ පොත්වල ඇත්තේ ද වැරදි මලක රූපයක් බවත් පාසල්වල පමණක් නොව ඇතැම් උසස් අධ්‍යාපන ආයතනවල ද උගන්වන්නේ වැරදි මලක රුව පෙන්වමින් බවත් ඇය පෙන්වා දුන්නා ය.



එමෙන්ම, පොත්පත්වල පමණක් නොව ආගමික ස්ථාන අසල නිල් මානෙල් ලෙස නම් කොට අලෙවි කෙරෙන්නේ ද සැබෑ නිල් මානෙල් නොවන බව මේ පර්යේෂකයන් දෙපළ ගේ අදහසයි.

මෙහිදී අදහස් දැක් වූ සභාපතිවරයා අවධාරණය කළේ මේ පිළිබඳ සලකා බලා නිර්දේශ ලබා දීමට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් විශේෂඥ කමිටුවක් පත් කර ඇති බවයි. උක්ත කරුණ පිළිබඳ කරුණු දැක්වූ මන්ත්‍රීවරයන්

# සංචාරකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් නව ජංගම යෙදවුමක් (App) - අමාත්‍ය හරීන් ප්‍රනාන්දු







සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ දී මෙරටට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් නව ජංගම යෙදවුමක් (App) හඳුන්වා දීමට කටයුතු කරන බව සංචාරක හා ඉඩම් අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මහතා පැවසී ය.

අමාත්‍යවරයා මේ බව පැවසුවේ සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ඒ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 30 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදී ය.

මෙරට සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ගෙන ඇති සහ ගැනීමට බලාපොරොත්තු වන පියවර පිළිබඳ පැහැදිලිකරමින් අමාත්‍යවරයා මේ බව පැවසූ අතර ජනවාරි මාසයේ දී මෙම ජංගම යෙදවුම භාවිතයට ගැනීමට බලාපොරොත්තු වන බව ද වැඩිදුරටත් පැවසීය.

එසේම මෙම යෙදවුම මගින් සංචාරකයන් කැමති නම් ඔවුන් සිටිනා ස්ථානය පිරික්සීමට අවසර ලබාදීම, ඒ තුළින් ඔවුන් අතරමං වුවහොත් හෝ යම් ආරක්ෂිත පියවරයක් ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ වෙනුවෙන් පියවර ගැනීමට හැකි බව ද අමාත්‍යවරයා වැඩිදුරටත් පැහැදිලි කළේ ය.

තව ද සංචාරකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් සංචාරක පොලිස් කණ්ඩායමක් සංචාරක ආකර්ෂණය සහිත සෑම මුහුදු තීරයකම ස්ථානගත කිරීමට කටයුතු කරන බව ද අමාත්‍යවරයා පැවසී ය. විශේෂයෙන්ම 2023 වර්ෂයේ දී සංචාරකයින් ලක්ෂ 15 මෙරටට ගෙන්වා ගැනීමට සැලසුම් කොට ඇති බව ද හරීන් ප්‍රනාන්දු මහතා මෙහි දී සඳහන් කළේ ය.

එසේම ඉඩම් මැනුම් කටයුතු ප්‍රමාදවීම පිළිබඳව ද මෙහි දී සාකච්ඡා වූ අතර අමාත්‍යවරයා පෙන්වා දුන්නේ මෙම මිනුම් කටයුතු බාහිර පාර්ශ්ව මගින් ඉටුකර ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කොට ඉක්මනින් මෙම මැනුම් කටයුතු අවසන් කිරීමට කටයුතු කරන ලෙසයි. මේ පිළිබඳ වාර්තාවක් මීළඟ කමිටු වාරයේ දී ලබාදීමට ද අමාත්‍යවරයා මෙහි දී නිර්දේශ කළේ ය.

මීට අමතරව විවිධ දිස්ත්‍රික්කවල පවතින ඉඩම් සම්බන්ධ ගැටලු පිළිබඳව සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම පිළිබඳව මෙහි දී සාකච්ඡා විය.

# විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ යෝජනා කිරීමට සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත්කළ කමිටුවේ වාර්තාව, ප්‍රතිපත්ති සම්පාදන ජාතික සභා අනුකමිටුවේදී සාකච්ඡාවට...

විදුලිබල ක්ෂේත්‍රයේ සිදුකිරීමට නියමිත ප්‍රතිසංස්කරණ යෝජනා කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව කෙටි, මධ්‍යම හා දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනුකමිටුවේ දී මේ මස සාකච්ඡාවට ගැනිණි.



පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ සභාපතීත්වයෙන් පැවති මෙම කාරක සභා රැස්වීමට විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු කංචන විජේසේකර, රාජ්‍ය අමාත්‍යවරුන් වන ගරු ඩී.වී. චානක, ගරු ඉන්දික අනුරුද්ධ යන මහත්වරුන් ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි, ගරු අසංග නවරත්න සහ ගරු සාගර කාරියවසම් යන මහත්ම මහත්මීහු ද සහභාගී වූහ.

විදුලිබල ක්ෂේත්‍රයේ යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව නිලධාරීන් විසින් මෙහි දී කමිටුවට කරුණු දැක්වී ය. ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ නියාමනය සඳහා ස්වාධීන ආයතන පහක් පිහිටුවීමට මෙහි දී යෝජනා කර ඇති බව ද කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයෙක් විසින් කමිටුවට දැනුම් දෙන ලදී. විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය සඳහා කිසිදු යෝජනාවක් මෙම කමිටු වාර්තාවේ නොමැති බවත් ඒ මහතා පැවසී ය.

ප්‍රතිව්‍යුහගත කිරීමේ දී විදුලි උත්පාදනය ඇතුළු කාර්යයන් සඳහා සම්බන්ධවන පාර්ශ්ව අනුමනය කළ යුතු ක්‍රමවේදයන් සරල කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ද අනුකමිටු සභාපති ගරු නාමල් රාජපක්ෂ මහතා මෙහිදී පෙන්වා දුන්නේ ය.



විදුලිබල ක්ෂේත්‍රයේ පමණක් නොව අනෙකුත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වෙනම ආයතනයක් පිහිටුවීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා පාර්ලිමේන්තුව හරහා අදාළ නීති සම්පාදන කටයුතු සම්බන්ධයෙන් ජාතික සභාවට යෝජනා කරන බවත් අනුකමිටු සභාපතිවරයා සඳහන් කළේ ය.

විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් වන තුරු ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ ලේකම් කාර්යාලයක් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව අමාත්‍ය කංචන විජේසේකර මහතා මෙහි දී අවධාරණය කළේ ය.

එසේම කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේ විදුලි බල ක්ෂේත්‍රයේ පමණක් නොව සෑම ක්ෂේත්‍රයකම කාර්යයන් සඳහා නිශ්චිතව වගකියන නිලධාරීන් කවුරුන් ද යන්නත් ඔවුන් නියමිත කාර්ය සාධන මට්ටමට ළඟා නොවූයේ නම් ඉවත් කිරීමටත් ප්‍රතිපාදන තිබිය යුතු බවයි. දේශපාලඥයන් මැතිවරණයක දී ඉවත් කිරීමට ජනතාවට බලයක් ඇතත් නියමිත කාර්ය සාධන මට්ටම් නොපෙන්වන නිලධාරීන් සහ ආයතන සම්බන්ධයෙන් ද පියවර ගැනීමට නිශ්චිත ප්‍රතිපත්ති නොමැති වීම ගැටලුවක් බවත් ඔහු පෙන්වා දුන්නේ ය. එම ගැටලුව විදුලිබල ක්ෂේත්‍රය තුළත් දැකිය හැකි බැවින් එම තත්ත්වය වෙනස් කිරීමේ අවශ්‍යතාව මෙහි දී දැඩිව අවධාරණය කෙරිණි.

# ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට ජනාධිපති ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් අනුකමිටුවක්....



නියාමනයක් සහිතව ජාතිත ප්‍රතිපත්ති නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික ආකෘතියක් සැකසීම සඳහා ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතාගේ සභාපතීත්වයෙන් අනුකමිටුවක් පත් කිරීමට මේ මස  01 වැනිදා පැවති කෙටි, මධ්‍යම හා දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනුකමිටුවේදී තීරණය විය.



එසේම මෙහි අනෙකුත් සාමාජිකයන් ලෙස අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් ප්‍රියන්ත මායාදුන්න යන මහත්වරුන් මෙන්ම මුදල් අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් අදාළ ආයතනවල නියෝජිතයන් පත් කිරීමට මෙහි දී කටයුතු කෙරිණි. .



පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 01 වැනිදා රැස් වූ මෙම කාරක සභාවට ජනාධිපති ලේකම් සමන් ඒකනායක, අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක සහ රාජ්‍ය පරිපාලන ලේකම් ප්‍රියන්ත මායාදුන්න යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.



ප්‍රතිපත්ති ගොඩනැගීම, ක්‍රියාත්මක කිරීම මෙන්ම අධීක්ෂණය සඳහා ස්වාධීන වූ ආයතනයක් ලෙස පනතක් මගින් මෙම කොමිෂන් සභාව පිහිටුවීමට අපේක්ෂා කරන බවත් එහි මූලික සැලසුම් ජනවාරි මැද භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් අනුකමිටු සභාපති ගරු නාමල් රාජපක්ෂ මහතා මෙහි දී පැවසී ය.

මෙහි දී අදහස් දක්වමින් නිලධාරීහු පෙන්වා දුන්නේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට මෙන්ම නියාමනයට හා අධීක්ෂණයට අවශ්‍ය පූර්ණ නෛතික බලය  මෙම කොමිෂන් සභාවට ලබා දිය යුතු බවයි.  මෙවැනි ස්වාධීන ආයතනයක් ඔස්සේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සාර්ථක වූ ලොව අන් රටවල ආකෘතීන් ද අධ්‍යයනයට ලක් කරමින් මෙම සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාවයද මෙහිදී සාකච්ඡා විය.

# පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ මහතා තරුණයන් වෙනුවෙන් වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිවරයා ලෙස තේරී පත්වෙයි

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ මහතා "තරුණයන් වෙනුවෙන් වන පාර්ලිමේන්තු සංසදයේ" සභාපතිවරයා ලෙස මේ මස 03 වැනිදා තේරී පත්විය.
ඒ "තරුණයන් වෙනුවෙන් වන පාර්ලිමේන්තු සංසදයක්" නවවැනි පාර්ලිමේන්තුව සදහා ස්ථාපනය කිරීමට පැවති රැස්වීමේදී ය.

සභාපතිවරයා ලෙස හේෂා විතානගේ  මහතාගේ නම පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු  බුද්ධික පතිරණ මහතා විසින් යෝජනා කළ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ සහ ගරු එස්.එම් මරික්කාර් යන මහත්වරුන් විසින් ස්ථිර කරන ලදී.තවද නියෝජ්‍ය සභාපතිවරුන් ලෙස ගරු මංජුලා දිසානායක, ගරු ප්‍රේම්නාත් සී දොලවත්ත සහ ගරු වීරසුමන වීරසිංහ යන මන්ත්‍රීවරයන් තේරී පත්වූහ.



සංසදයේ අභිනව සභාපති ගරු හේෂා විතානගේ මහතා මෙහි දී අදහස් දක්වමින් පවසා සිටියේ තරුණයන්ගේ අපේක්ෂාවන් මෙන්ම ගැටලු සදහා ඉදිරියේ දී සක්‍රීය ලෙස මැදිහත් වීමට මෙම සංසදය අපේක්ෂා කරන බවයි. රටෙහි ප්‍රතිපත්ති හා නීති සම්පාදනය ඇතුළු කටයුතුවලට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම ප්‍රවර්ධනය සඳහා සංසදය මගින් ක්‍රමවත් වැඩපිළිවෙළක් යෝජනා කිරීමට අපේක්ෂා කරන බවත් ඒ මහතා පැවසී ය.



මෙහිදී අදහස් දක්වමින් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරයන් පවසා සිටියේ තරුණ ප්‍රජාව තුළ විශ්වාසයක් ගොඩ නැගෙන පරිදි කටයුතු කළයුතු බවයි. පාර්ලිමේන්තුව තුළ තරුණ නියෝජනය වැඩි කිරීමට මෙන්ම දේශපාලන පක්ෂ තුළ තරුණ නියෝජිතයන්ට වැඩි අවස්ථාවක් ලබා දීම සදහා ඇති අවශ්‍යතාව පිළිබඳව ද පළාත් පාලන ආයතන, පළාත් සභා මෙන්ම පාර්ලිමේන්තු මැතිවරණ සදහා තරුණ නියෝජනය සදහා වැඩි අවස්ථාවක් ලබාදීමේ අවශ්‍යතාව ද මන්ත්‍රීවරු මෙහි දී පෙන්වා දුන්හ. එසේම පාර්ලිමේන්තුවේ කාරක සභා සදහා තරුණ නියෝජිතයන් සම්බන්ධ කර ගැනීම හරහා පාර්ලිමේන්තුවේ ක්‍රියාවලිය සඳහා තරුණ දායකත්වය ලබා ගැනිමේ ක්‍රමවේදයන් පිළිබඳව ද අවධානය යොමුවිය.



එසේම සංසදයේ ඉදිරි වැඩකටයුතුවලට අදාළ යෝජනා සහ අදහස් ඉදිරිපත් කරන ලෙස ද සියලුම මන්ත්‍රීවරයන්ගෙන් ගරු සභාපතිතුමා ඉල්ලීමක් කළේ ය.
දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව මෙම සංසදය හරහා සාමූහිකව තරුණයන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු මෙහිදී අවධාරණය කළහ.

# ආර්ථිකය අර්බුදය හමුවේ ජනමාධ්‍ය ආයතනවලටත් අභියෝග රැසකට මුහුණ දෙන්න සිදුවෙලා - ආර්ථික ස්ථායිකරණ ජාතික සභා අනුකමිටුව හමුවේ ජනමාධ්‍යවේදීහු පවසති...





වත්මන් ආර්ථික අර්බුදය හමුවේ මෙරට ජනමාධ්‍ය ආයතන පවත්වාගෙන යාමේ දී අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇති බව මේ මස 15 වැනිදා පාර්ලිමේන්තුවේ දී පැවති ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනුකමිටුවේදී ජනමාධ්‍ය ආයතන නියෝජිතයෝ පැවසූහ.

ආර්ථික අර්බුදය හමුවේ ජනමාධ්‍ය ආයතනවල ගැටලු සහ ඊට අදාළ විසඳුම් සහ යෝජනා සාකච්ඡා කිරීම සඳහා  පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 15 වැනිදා පැවති ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනුකමිටුවේ දී මෙම කරුණු අනාවරණය විය.

රූපවාහිනී, ගුවන්විදුලි සහ පුවත්පත් යන ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය ආයතන මෙන්ම වෙබ් මාධ්‍ය, සහ සමාජ මාධ්‍ය නියෝජනය කරමින් ජනමාධ්‍යවේදීහු මෙම අවස්ථාවට කැඳවා තිබිණි.

ආර්ථික අර්බුදය හමුවේ සමාගම්වල නිෂ්පාදන පිරිවැය ඉහළයාමෙන්  වෙළඳ දැන්වීම්  සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය දළ වශයෙන් 70% ක ප්‍රමාණයකින් අඩුවී ඇති බව මෙහි දී අනාවරණය විය.



රාත්‍රී ප්‍රමුඛ කාලය තුළ (Prime time) සිදුවන විදුලි කප්පාදුව නිසා රූපවාහිනී ආයතනවලට වෙළඳ දැන්වීම් ලැබෙන ප්‍රමාණය පහත වැටී ඇති බව ද වත්මන් ආර්ථිකය තුළ වැඩසටහන් නිෂ්පාදනය සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුවන බවට ද මෙහි දී කරුණු අනාවරණය විය.

කඩදාසි හිඟය ඇතුළු නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා පුවත්පත් ඇතුළු ප්‍රකාශන කර්මාන්තවල විශාල පසුබෑමක් සිදුව ඇති බව පුවත්පත් නියෝජනය කරමින් පැමිණි මාධ්‍යවේදීහු කරුණු පෙන්වා දුන්හ. මෙම තත්ත්වය නිසා පුවත්පත්වල පිටු සීමා කිරීමටත් මිල ඉහළ දැමීමටත්  සිදුව ඇති බව ද ඔවුහු පෙන්වා දුන්හ. පුවත්පත් පිටු අඩුවීමෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ පුවත් සඳහා ඉඩක් නොලැබෙන

තත්ත්වයක් ඇතිවී ඇති බවත් ඔවුන්ට ගෙවීම් පවා සිදුකළ නොහැකි වී ඇති බවත් ඔවුහු වැඩිදුරටත් පෙන්වා දුන්හ.



එසේම ඇතැම් පුවත්පත් ආයතනවල ස්ථිර කාර්ය මණ්ඩලයට වැටුප් පවා ගෙවීමට අපහසු තත්ත්වයන් ඇතිවී ඇති බවත් මෙහි දී හෙළිවිය. මෙම තත්ත්වය තුළ පුවත්පත් මුද්‍රණය 60% - 70% ක ප්‍රමාණයකින් අඩුවී ඇති බවත් ඔවුහු පෙන්වා දුන්හ.



මේ අනුව  ආර්ථික ගැටලු, ප්‍රාදේශීය පුවත් පළ නොවීම ආදී හේතු නිසා ජනතාව අතර පුවත්පත් සංසරණය මේ  වන විට විශාල ලෙස අඩුවී ඇති බවත් පුවත්පත් මාධ්‍යවේදීහු පෙන්වා දුන්හ. ආර්ථික අර්බුදයට අමතරව සමාජ මාධ්‍ය ඇතුළු වත්මන් ඩිජිටල් මාධ්‍ය ප්‍රවණතාවන් හේතුවෙන් ද පුවත්පතට සහ ගුවන්විදුලියට විශාල අභියෝගයකට මුහුණදීමට සිදුව ඇති බව මෙහි දී අනාවරණය විය.



වත්මන් අර්බුදකාරී තත්ත්වයට මුහුණ දීම සඳහා ජනතාව සූදානම් කිරීමට සියලු ජනමාධ්‍ය ආයතන ඒකාබද්ධව එක ඉලක්කයකට යාමට රජය ඒකාබද්ධ ප්‍රයත්නයක් දැරිය යුතු බවට ද මෙහි දී මත පළ විය. සුනාමි ව්‍යසනය, ත්‍රස්තවාදය පරාජය කිරීම, කෝවිඩ් අර්බුදය ජය ගැනීම වැනි අවස්ථා  සඳහා මාධ්‍ය ක්‍රියාකළ අයුරින් මේ මොහොතේ ද කටයුතු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මෙහි දී අවධානය යොමුවිය.

මෙම සියලු අදහස් යෝජනාවලට අවධානය යොමු කරමින් අනුකාරක සභාපතිවරයා පැවසුවේ මෙම කරුණු ඇසුරින් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ යෝජනා ඉදිරි වාර්තාවට ඇතුළත් කොට ජාතික සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවයි.





# කැසිනෝ ව්‍යාපාර (නියාමනය) පනත යටතේ නියමය සහ නියෝග සඳහා දැඩි කොන්දේසි යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමි වෙයි...





2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය) පනත යටතේ නියමය සහ නියෝගය සඳහා දැඩි කොන්දේසි සිහිතව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමි විය.

මේ සඳහා අනුමතිය හිමි වූයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 06 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදී ය.

මීට පෙර ද මෙම නියමය සහ නියෝගය පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී අවස්ථා කිහිපයකදීම සාකච්ඡා කළ අතර මෙය අනුමත කර ගැනීම සඳහා මේ මස 05 වැනිදා කාරක සභාව වෙත ඉදිරිපත් කෙරිණි. නමුත් කැසිනෝ නියාමන ආයතනයක් පිළිබඳව ක්‍රියාකාරී සැලැස්ම සහ කාලරාමුව ඇතුළු තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් එම තොරතුරු මේ මස 06 වැනි දින කාරක සභාව වෙත ඉදිරිපත් කොට මේ සඳහා අනුමතිය ලබාගන්නා ලෙස මුදල් අමාත්‍යාංශ නිලධාරීන්ට කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.

මේ අනුව මෙදින එම ක්‍රියාකාරී සැලැස්ම සහ කාල රාමුව ඉදිරිපත් කිරීම හා ඉන්දියාව, මැලේෂියාව, බංගලාදේශය යන රටවල කැසිනෝ ව්‍යාපාරය සඳහා බදු අයකරගැනීම පිළිබඳ නිදසුන් සහිතව තොරතුරු ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යාංශ නිලධාරීන් විසින් සිදු කරන ලදි. 2024 වර්ෂය දක්වා කාල රාමුවක් සහිත



සැලැස්මක් නිලධාරීන් මෙහි දී ඉදිරිපත් කළ අතර කාරක සභාවේ සභාපතිවරයා එය සලකා බලා එම කාලසීමාව වැඩි බවත් මේ සම්බන්ධ නීතිමය කටයුතු, අනුමතීන් ලබාගැනීම ඇතුළු සියලු කටයුතු 2023 සැප්තැම්බර් අග වන විට අවසන් කළ යුතු බවත් නිර්දේශ කරන ලදි.

මේ අනුව එම ලබාදුන් ක්‍රියාකාරී සැලැස්ම සහ කාල රාමුව අනුව කටයුතු සිදු කරන්නේ ද යන්න රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත්ව මේ සඳහා අනුමතිය ලබාදීම සිදු විය.

මෙහිදී කාරක සභා සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා පෙන්වා දුන්නේ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත 2010 වසරේ සිට බලාත්මක වී වසර 12ක් වැනි දීර්ඝ කාලයක් ගතවී තිබුණ ද නියාමනය සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනයක් නොමැති වීම ගැටලු සහගත බවයි. එසේම සකස්කොට ඇති මෙම ක්‍රියාකාරී සැලැස්ම අනුව ද ඉක්මනින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම වැදගත් වන බව හෙතෙම පෙන්වා දුන්නේ ය.

# ජාත්‍යන්තර භික්ෂු නියෝජිත පිරිසක් කථානායකවරයා හමුවෙති.

ජාත්‍යන්තර බෞද්ධ ජාලයක් නියෝජනය කරන භික්ෂු භික්ෂුණීන් වහන්සේලා පිරිසක් මේ මස කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවූහ. මියන්මාරය, තායිලන්තය සහ ශ්‍රී ලංකාව යන රටවල් නියෝජනය කරන භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙම පිරිසට අයත් විය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ද සහභාගී වූ මෙම හමුවේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමානාත්මතාව පිළිබඳ, සහ ඊට අදාළව අවදානමට ලක්විය හැකි කණ්ඩායම් මෙන්ම ඒ සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳව මෙහිදී සාකච්ඡා විය.

මෙහි දී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට මියන්මාර සංස්කෘතික උරුමයක් ලෙස සැලකෙන වටිනා ග්‍රන්ථයක් පිළිගන්වන ලදී. මෙම  ග්‍රන්ථය රචනා කිරීමට වසර 30ක් ද ඉංග්‍රීසි බසට පරිවර්තනය සඳහා වසර 20ක් ද ගත වූ බවත්, එය ඔවුන්ගේ ජාතික උරුමයක් බවත් මියන්මාරය නියෝජනය කරමින් පැමිණි පිරිස ප්‍රකාශ කළහ.

ශ්‍රී ලංකාවේ සිටින භික්ෂුණීන් වහන්සේලාට ජාතික හැඳුනුම්පතක් ලබාගැනීමට අවකාශයක් නොමැතිවීම සම්බන්ධයෙන් මෙරට දූත පිරිසේ භික්ෂුණීන් වහන්සේලා කථානායකවරයාගේ අවධානයට ලක් කළහ. මේ නිසා තරුණ භික්ෂුණීන් වහන්සේලාට රාජ්‍ය විභාගවලට සහභාගි වීම ද ගැටලුවක් බවට පත්වී ඇති බව මෙහි දී සාකච්ඡාවට ලක්විය.















# පාර්ලිමේන්තුව සැකෙවින්...

## දෙසැම්බර් 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

## දෙසැම්බර්

### 02 සිකුරාදා

- තරුණයන් සඳහා පාර්ලිමේන්තු සංසදයක් ස්ථාපනය කිරීම පිළිබඳව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.

### 08 බ්‍රහස්පතින්දා

2023 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සංශෝධන සහිතව පාර්ලිමේන්තුව විසින් යථාපරිදි සම්මත කර කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් විසර්ජන පනත් කෙටුම්පතට 2022 අංක 43 දරන පනත වශයෙන් සිය සහතිකය සටහන් කිරීම.

### 09 සිකුරාදා

- 2018 අංක 19 දරන ජාතික විගණන පන්තේ 35(1) වගන්තිය ප්‍රකාරව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත පිළිගන්වන ලද ජාතික විගණන කාර්යාලයේ 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය වැඩසටහන එකී පන්තේ 35(3) වගන්තිය යටතේ කථානායකවරයා වෙනුවෙන් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවේ සභාගතකිරීම.

- එකතු කළ අගය මත බදු (සංශෝධන) සහ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත් ද්විත්වය දෙවැනි වර සහ තුන්වැනි වර කියවා සංශෝධන සහිතව යථාපරිදි පාර්ලිමේන්තුව විසින් සමමත කිරීම.

  එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා පක්ෂව ඡන්ද 82 ක්ද, විපක්ෂව ඡන්ද 52ක්ද ලැබුණු අතර තෙවැනි වර කියවීම සඳහා ද පක්ෂව ඡන්ද 82ක්ද විපක්ෂව ඡන්ද 42ක්ද ලැබුණි.
  දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා ද පක්ෂව ඡන්ද 83ක්ද විපක්ෂව ඡන්ද 42ක්ද ලැබුණු අතර තෙවැනිවර කියවීම සඳහා ද පක්ෂව ඡන්ද 79 ක්ද විපක්ෂව ඡන්ද 36 ක්ද ලැබුණි.

### 13 අඟහරුවාදා

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවීම සම්බන්ධව විමර්ශනය කිරීමට සහ ඒ සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව නමැති විශේෂ කාරක සභා ද්විත්වය පාර්ලිමේන්තුව විසින් යථාපරිදි සම්මත කිරීම.

- මුළු දවස පුරාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීම සහ පිළිතුරු ලබාදීම.

**15 බ්‍රහස්පතින්දා**

- 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කරමින් සංශෝධන සහිතව පාර්ලිමේන්තුව විසින් යථාපරිදි සම්මත කර කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පතට 2022 අංක 44 වශයෙන් සහතිකය සටහන් කිරීම.

**19 සඳුදා**

- 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කරමින් සංශෝධන සහිතව පාර්ලිමේන්තුව විසින් යථාපරිදි සම්මත කර කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පතට 2022 අංක 44 වශයෙන් සහතිකය සටහන් කිරීම.

**21 බදාදා**

- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව ස්ථාපිත කරන ලද ආංශික අධීක්ෂණ කාරක සභාවලට තරුණ නියෝජිතයින් පත්කර ගැනීම පිණිස අයදුම්පත් කැඳවීම.

පාර්ලිමේන්තු

# ඡායා ගැලරිය















දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් පාසල් 32 කට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5000 කට අධික පිරිසක් පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේ ඡායාරූප..








පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලියේ ජයසංකේත සහ සහතික පත් ප්‍රදානය ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තුවේ බිලියඩ් ශාලාවේ දී මේ මස (08) වැනිදා පැවැත්විණි.

# පාර්ලිමේන්තු විත්ති


**පුවත් හසුන | 30 වැනි කාණ්ඩය | දෙසැම්බර් 2022**

**ISSN 2806 – 5425**



**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka